කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර) -2015

2021 - මාර්තු / නොවැම්බර්

**BCOME 2063 - විගණනය**

ප්‍රශ්න සංඛ්‍යාව : (පහයි ) 05 කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

ප්‍රශ්ණ අංක 01

අ) ශ්‍රී ලංකා ආකෘතිමය රාමුවට අනුව, "සහතික වීමේ සේවාවන්" (Assurance Engagement) යන යෙදුම පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ආ) "සාධාරණ සහතික කිරීමේ සේවාවන්" "සීමිත සහතික කිරීමේ සේවාවන්" වලින් වෙන්කර හඳුනා ගන්න.

(ලකුණු 04)

ඇ) සහතික කිරීමේ සේවාවන්හි දක්නට ලැබෙන ලක්ෂණ පැහැදිලි කරන්න.

(ලකුණු 12)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්ණ අංක 02

අ) මව් ආයතනයක විගණකවරයා, එහි පරිපාලිතයේ ද විගණකවරයා වන විට, පරිපාලිත ආයතනයට වෙනම ගිවිසුම් ලිපියක් යැවිය යුතුද යන තීරණයට බලපාන සාධක මොනවාද?

(ලකුණු 04)

ආ) විගණන අවදානමේ කොටස් තුන කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 06)

ඇ) "විගණකවරයෙකුට මූල්‍ය ප්‍රකාශන පිළිබඳ පූර්ණ සහතිකයක් ලබා ගත නොහැක" . ඔබ එකඟ වේද? ඔබේ පිළිතුර සාධාරණීකරනය කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්ණ අංක 03

අ) SLAuS 240 ට අනුකූලව "වංචාව" "වැරදි" වලින් වෙන්කර හඳුනා ගන්න.

(ලකුණු 04)

ආ) ආයතනයේ මූල්‍ය ප්‍රකාශනතුල සිදුකළ හැකි විවිධ ආකාරයේ වංචනික ක්‍රියාකාරකම් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 04)

ඇ) විගණනය ආරම්භ කිරීමට පෙර, විගණක විසින් අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්ණ අංක 04

අ) විගණන ආයතන මට්ටමින් තත්ත්වපාලන ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සකස් කිරීමේදී, විගණන සමාගමක් විසින් සලකා බැලිය යුතු කරුණු මොනවාද?

(ලකුණු 08)

ආ) විගණන ආයතන මට්ටමින්, විගණන නිලධාරීන්ගේ "කුසලතා සහ නිපුණතාව" පවත්වා ගැනීම සඳහා සුදුසු තත්ත්ව පාලන ක්‍රමවේදයන් සැලසුම් කරන්න.

(ලකුණු 12)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්ණ අංක 05

පහත සඳහන් කරුණු පැහැදිලි කරන්න.

අ) විගණන සැලැස්ම (Audit Plan)

ආ) ලේඛනගත කිරීම (Documentation)

ඇ) පුනරාවර්තන විගණන (Recurring Audits)

ඉ) මූල්‍ය ප්‍රකාශන සැදැහුම් (Financial Statement Assertions)

**(ලකුණු 05 x 4 = ලකුණු 20)**